

උයන් කෙළි පිණිස ගිය සිදුහත් කුමරු සසර කළකිරි ගිහිගෙයින් නික්ම යන අවස්ථාව

## ஃ මහා පරිනිබ්බාන සූත්‍රයෙන් හෙළිවන බුද්ධ චරිතය

– නිර්මලා අමරසිංහ

මහා පරිනිබ්බාන සූත්‍රයේ දැක්වෙන කරුණු ඇසුරෙන් බුද්ධ චරිතය පිළිබඳ සිදුකැරෙන විග්‍රහයෙකි. පිරිනිවන් පෑමට ආසන්න අවස්ථාවේදී බුදුරදුන් හැසිරුණු ආකාරය – දෙසූ වදන් – දුන් ඔවදන් ආදිය ඇසුරෙන් ප්‍රකට වන උන්වහන්සේගේ මහා කරුණා ගුණය සහ දූරදර්ශී ශාස්තෘත්වය හෙළිදරව් කිරීමයි, ලේඛකයාගේ උත්සාහය.

## ஃ ධනය පරිහානිය

– කෝමාරිකේ රාහුල හිමි

ධනය ඉපයීම හා ඊට අදාළ සීමා, ධනය ජීවිතයට වඩාත් ඵලදායක ලෙස පරිහරණය කළ යුතු ආකාරය ආදී වූ විශේෂයෙන් ගිහි ජීවිතයක් ගත කරන බෞද්ධයාට ප්‍රයෝජනවත් මඟපෙන්වීමක් ඇතුළත් බුද්ධ දේශනාවකට අර්ථ විවරණයකි.

## ஃ දෙලොව සතුටුවීමේ රහස

– දිවියාගහ යසස්සි නාහිමි

'සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්' විශේෂාංගය යටතේ පළවන මෙම ලිපියෙන් මෙලොවදී ද – පරලොවදීද එක සේ සතුටෙන් – ප්‍රමෝදයෙන් ජීවත්විය හැකි ප්‍රතිඵල ලබා දෙන පිළියමක් පිළිබඳවය, පැවසෙන්නේ. 'කර්ම විශුද්ධිය' නම් වූ සුපිරිසුදු චේතනා සහිත ක්‍රියා කලාපය එම දෙලොව සතුටෙහි රහස බවයි – මෙම කුඩා ලිපියෙන් කියැවෙන්නේ.

## ஃ සැබෑ මිතුරා හඳුනාගනිමු

– කෝමාරිකේ රාහුල හිමි

නියම මිත්‍රයා හඳුනාගන්නා ආකාරය, මිත්‍ර ප්‍රතිරූපක වංචනිකයන්ගේ ස්වභාව, යහපත් මිත්‍රත්වයක් පවත්වාගැනීමට පුද්ගලයා සතුව පැවතිය යුතු ගුණ ධර්ම ආදී වූ 'මිත්‍රත්වය' පිළිබඳ දෙසුණු බුදු වදන් කිහිපයක් පිළිබඳ විමසමකි.

## ஃ ධර්ම සන්නිවේදනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

– මහාචාර්ය දේවාලේගම මේධානන්ද හිමි

ධර්ම සන්නිවේදකයා සතුව තිබිය යුතු සුදුසුකම්, ධර්ම සන්නිවේදනයේදී මුහුණදෙන ගැටලු, ශ්‍රාවකයා හඳුනාගැනීම, විවිධ කුසලතා හා ගුණාංග සහිත ධර්ම කථිකයන්ගේ ස්වභාව ආදී වූ ධර්ම සන්නිවේදනය කේන්ද්‍ර කොටගත් වැදගත් විෂය කරුණු කිහිපයක් පිළිබඳ විමර්ශනයකි.

## ஃ බුදුදහමේ හේතුඵලවාදය විශ්ව ධර්මතාවක්

– පිටිදූවේ සිරිධම්ම හිමි

ලෝකයේ හා සත්වයාගේ පැවැත්ම සිදුවන නියමය වශයෙන් බුදුදහමේ දැක්වෙන හේතු–ඵල ක්‍රමය මුළු විශ්වයටම පොදු ධර්මතාවක් බවද, වෙනත් ආගම් අතර බුදුදහම සුවිශේෂත්වයට පැමිණෙන ඉගැන්වීම එය බවද, විද්‍යා ඥාණයෙන් අතිශයින් දියුණු මට්ටමක සිටින නූතන ලෝකයේද ඉගැන්වීම බවද මෙම ලිපියෙන් පැවසේ.

## ஃ ඉඳුරන් පිනවන ආසාව නිවන් මඟ අවුරනවා

– වදමල්දෙණියේ සෝමාලෝක හිමි

පොහෝද ධම් දේශනාව යටතේ ඇස, කන, නාසය, දිව, කය, මනස යන ෂඩ් ඉන්ද්‍රියයන් පිනවන ද පිළිබඳ අසිරියෙන් – අයෝනිසෝමනසිකාරයෙන් (නුනුවණින් මෙහෙනහි කරමින්) සිටීම නිසා සිත තුළ පහළවන ක්ලේශ ධර්මතා කිහිපයක් පිළිබඳ විස්තරයක් ද – ඒවා නිසා නිවන් මඟ වැසී යන ආකාරයද පැහැදිලි කරදී ඇත.

## ஃ බුදුදහමේ විද්‍යාත්මක පදනම යථාවබෝධයයි

– රුහුණු විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය ඩල්සි සේනාරත්න

ලෝකය සහ සත්වයා පිළිබඳ යථාවබෝධය – බුද්ධ දේශනාවෙහි අරමුණ බවද, විද්‍යාවේද අරමුණ එය බවද, ඒ අනුව බුදුදහම තුළ දක්නට ලැබෙන්නේ සැබෑ විද්‍යාත්මක චින්තනයක් බවද පෙන්වාදීම ලේඛකයාගේ අරමුණ වී ඇති බව පෙනේ.

## ⁘ සදහම් දැනුම

– වහුමුවේ විජයවංස නාහිමි
බුදුදහම සහ ඒ ඇසුරු කොටගත් විෂයයන් පිළිබඳ පාඨකයාට දැනුම ලබා දෙන – සරල හා කෙටි ප්‍රශ්නෝත්තර ඇතුළත් විශේෂාංගයකි.

## ⁘ නින්දා නොකිරීම

– උඩුවේ ධම්මාලෝක හිමි
'දියුණුවේ දෙරටු' විශේෂාංගය යටතේ සමාජයේ ඇතැම් අය තුළ පවතින අනූනට නින්ද කිරීමේ පිළිවෙතෙහි අයෝග්‍යතාවයි, මෙම කුඩා ලිපියෙන් පහදා දීමට උත්සාහ කැරෙන්නේ.

## ⁘ සිත් සනසන සෙනසුන මඩකඩ ආරණ්‍ය සේනාසනය

– ජනක වෙත්තසිංහ
කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රදේශයේ හොට්ටියාවත්ත ග්‍රාමයේ පිහිටි – සිත් සනසන – සුන්දර වන සෙනසුනක රමණීයත්වය විස්–තර කැරෙන කුඩා ලිපියකි.

## ⁘ Significance of 'Vap'

***-by Danister I. Fernando***

## ⁘ වප් පොහොයයි පවාරණයයි

– පැලියගොඩ සුදර්ශන හිමි
පැරැණි – වැදගත් ශාසනික සම්ප්‍රදායයක් ලෙස භික්ෂූන්වහන්සේ තෙමසක් පුරා වස් වාසය කොට වස් පවාරණය කළ යුතු ආකාරය – ශාසන විනයානුකූල ලෙස පහදා දීමට දරන උත්සාහයකි.

## ⁘ පරිසරයේ සොබා සිරියෙන් වීතරාගීහුද සැනසෙති

– මහින්ද කරුණාදාස ලියනාරච්චි
සසුන් මහට ප්‍රවේශ වූවන්ට සුන්දර පරිසරයේ සොබා රමණීයත්වය කොතරම් පිටුබලයක් වූවාද යන්න රාගාදී කෙලෙස් මුළුමනින් දුරු කළ රහතන්වහන්සේ පවා සොබා සුන්දරත්වයේ අසිරියෙන් නිවී සැනසී වැඩ වාසය කළ ආකාරය.

## ⁘ ඔබ කෙබඳු බිරියක්ද?

– සිරිපාල මාදුවගේ
විවාහ ජීවිතයක් ගතකිරීමේදී දක්නට ලැබෙන ක්‍රියා කලාපය අනුව විශේෂයෙන් තම සැමියාට දක්වන ප්‍රතිචාර අනුව විවාහවූ ස්ත්‍රීන් (භාර්යාවන්) වර්ග සතකට බෙදා දැක්වූ බුද්ධ දේශනාවකට අර්ථ විවරණයක් හැටියට – මෙම ලිපිය හැඳින්විය හැකිය.